සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය -- 2019

## 7 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය :– ..............................................................................** **කාලය : පැය 02 යි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

I කොටස

(1) සිංහල අක්ෂර මාලාවෙහි සඤ්ඤක අක්ෂර සංඛ්‍යාව වන්නේ,

(1) දහයකි. (2) පහකි. (3) හයකි. (4) හතරකි.

(2) මහාප්‍රාණ අක්ෂර පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) ක, ඡ, ඨ, ඵ, ඪ (2) බ, ජ, ඨ, ඵ, ඪ (3) ඛ, ඡ, ඨ, ඵ, ඪ (4) ඛ, ඡ, ට, ඵ, ඪ

(3) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

(1) විමර්ෂණ, පිළිවෙල, ශිෂ්ඨාචාරය, ඛනිජ
(2) සංස්ථාර, ප්‍රධානියා, අත්‍යවශ්‍ය, නිෂ්පාදන
(3) ප්‍රශ්ණ, සහශ්‍රය, අවශේෂ, පරිඝනකය
(4) හදාරණ, පරිශ්‍රය, අනුස්මරණය, ප්‍රවීන

(4) පහත සඳහන් පදවලින් උක්ත පදයක් නොයෙදුණු වරණය වන්නේ,

(1) වෛද්‍යවරු, වැද්දෝ, ගායිකාවක්, උගතෙක්
(2) ගුරුවරියක්, ශිෂ්‍යයෙක්, හාමුදුරුවෝ, පියාණෝ
(3) ඇත්තු, සමනල්ලු, පැටව්, මව්පියෝ
(4) කුරුල්ලන්, පුතා, දරුවෝ, වෙළෙන්දී

(5) විරුද්ධාර්ථ පද ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) යහගුණ - අවගුණ
(2) වේලාව - අවේලාව
(3) සම්මාන - අසමාන
(4) නම්බුව - අවනම්බුව

(6) ඉරි ඇඳි පදය අයත් වනුයේ කුමන ක්‍රියා වර්ගයට ද?

නංගී මල් නෙළයි.

(1) මිශ්‍ර ක්‍රියා (2) පූර්ව ක්‍රියා (3) අනවසාන ක්‍රියා (4) අවසාන ක්‍රියා

(7) පහත සඳහන් වාක්‍යාංශය වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.

සෙමින් ධාවනය කරන

(1) මන්දගාමී (2) උද්ගාමී (3) සමගාමී (4) අධෝගාමී

- **පහත සඳහන් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(8) නුඹලා දිනපතා දෙමාපියන් නැමද පාසල් ......................................

(1) යන්නේ ය (2) යන්නෝය (3) යන්නෙහු (4) යන්නෙහි



EXAMRESULTS.LK

(9) වීරෝදාර සෙබළු රට රැකීමට පෙරට ......................................

(1) ගියෙහු (2) ගියහ (3) ගියෙහි (4) ගියෙමු

(10) තුරුලතා සියලු සතුන්ට සෙවණ ......................................

(1) සදයි (2) සදති (3) සදන්නෝය (4) සදහි

(11) රාජකාරි ලිපියක ඇතුළත් විය යුතු මූලිකාංගවලට අයත් නොවන අංගය වනුයේ,

(1) ලබන්නාගේ ලිපිනය යි. (2) දිනය යි (3) ආශිර්වාදය යි. (4) ආමන්ත්‍රණය යි.

(12) මහ පුදුමෙකි
මලක මලෙකි
මෙහි 'මලක මලෙකි' යනු,

(1) උපමාවකි (2) අනුප්‍රාසවත් යෙදුමකි (3) රූපකයකි (4) එළිසමය යි.

(13) 'හීල් අඩුක්කුව' යනු,

(1) උදේ ආහාරය (2) රාත්‍රී ආහාරය (3) දවල් ආහාරය (4) සීතල ආහාර

(14) 'සේදූරි කරනවා' යනු,

(1) සායම් කරනවා (2) ඉක්මන් කරනවා (3) ගමන් කරනවා (4) ඇති දූඩි කරනවා

(15) පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු පදය තෝරන්න.
අරුම පුදුම රටේ .............................................................. පොල් හැටේ.

(1) පදමට (2) පණහට (3) මසුරමට (4) රුපියලට

● මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදය තෝරන්න.

(16) නෙලුම් - (සිලිලාර, පද්ම, අම්බුජ, සියපත)

(17) රජතුමා - (නරනිඳු, භූපති, නිරිඳු, සුරිඳු)

(18) නිවැරදිව පද බෙදා දක්වා ඇති වාක්‍යය තෝරන්න.

(1) කමත හා වී අතර බුදුන්වහන්සේ ගේ හා දෙවියන් ගේ සම්බන්ධතාවක් ඇතැයි සිංහලයෝ විශ්වාස කරති.
(2) පන්සිය පනස් ජාතක පොත කුරුණෑගල රාජධානි සමයේ ලියන ලද යි සැලකේ.
(3) මව් පිය සැම දෙනා දරුවන් සමඟ රැස්වීමට පැමිණියහ.
(4) 'ලෝවා මහා පාය' යන්නෙහි අර්ථය ලෝහයෙන් තැනූ ගොඩ නැගිල්ල යන්නයි.

● **පහත දක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පදය කුමන ක්‍රියා වර්ගයකට අයත්දැයි තෝරන්න.**

(19) මල්ලී කඩදාසියක් නවා ඔරුවක් සෑදුවේය.

(1) ආශිර්වාද ක්‍රියා (2) අවසාන ක්‍රියා (3) පූර්ව ක්‍රියා (4) මිශ්‍ර ක්‍රියා

(20) සිත්තරා සිතුවම අඳිමින් වර්ණ ගන්වයි.

(1) පූර්ව ක්‍රියා (2) ආශිර්වාද ක්‍රියා (3) මිශ්‍ර ක්‍රියා (4) අවසාන ක්‍රියා

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) ඔබ පන්තියේ සියලු දෙනාගේ ම නිර්මාණ ඇතුළත් කර බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීමට සිංහල විෂයභාර ගුරුභවතා ඔබට පවසා තිබේ. ඒ අනුව නිර්මාණය කළ බිත්ති පුවත් පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) එම බිත්ති පුවත්පත සඳහා යෙදූ නම ලියන්න. (ලකුණු 01)

(ii) බිත්ති පුවත්පත සැකසීම සඳහා ගුරුභවතාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) බිත්ති පුවත්පත සැකසීමෙන් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 05යි.)

(2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන **150කට නො අඩු** රචනාවක් ලියන්න.

(i) ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ක්‍රමවත් ව බැහැර කරමු.

(ii) කෘෂිකර්මාන්තයෙන් රට නංවමු.

(iii) වළකමු මඟ අනතුරු සිහි නුවණින්

(iv) ඉගෙනීම තුළින් අනාගතය ජය ගනිමු.

(iv) සොඳුරු වනපියසක අසිරිය වින්දෙමි. (ලකුණු 20)

(3) පහත සඳහන් කරුණු ඇසුරින් විද්‍යාලයේ අත්කම් නිර්මාණ ප්‍රදර්ශනය නැරඹීම සඳහා ආරාධනා කිරීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

| | |
|---|---|
| කාරණය | :- 7 ශ්‍රේණියේ දරුවන්ගේ අත්කම් නිර්මාණ ප්‍රදර්ශනය |
| ස්ථානය | :- සොඳුරුගම මහා විද්‍යාලයීය ප්‍රධාන ශාලාව |
| දිනය | :- 2019.08.05 |
| වේලාව | :- පෙ. ව. 9.30 - ප. ව. 4.00 දක්වා |
| ප්‍රධාන ආරාධිත අමුත්තා | :- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා |
| සංවිධාන කටයුතු | :- 7 ශ්‍රේණිය ශිෂ්‍ය සාහිත්‍ය සංගමය |

(ලකුණු 10)

(4) **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අවුරුදු දිනය ළං වන විට වැඩි අසිරියක් ගම පුරා හැම තැන ම අපි දකින්නෙමු. පාසල් නිවාඩුව නිසා අපේ සෙල්ලම් කිරීමේ ප්‍රමාණය උච්ච අවස්ථාවට පත් වෙයි. ගෙදර දොර බොහෝ දේ අලුත් වෙයි. නෑතිනම් අලුත් මුහුණුවරක් ගනී. ගෙදර පරිසරයට ගැළපෙන ලෙස අවට පරිසරය ද අලුත් වන බව අපට පෙනෙයි. ගම පුරා එරබදු ගස් රතු පාට මලින් පිරී යයි. එරබදු ගස් යට රතු පලසක් එලූ කලක මෙන් මල් වැටී රක්ත වර්ණයෙන් පිරී යයි. බක්මහ අකුණු සමග වැටුණු වැස්සෙන් සියලු ගහ කොළ නව පණක් ලද්දා මෙන්, තද හරිත පැහැයෙන් නව දලු ලා වැඩේ.

(i) ඡේදයෙහි සඳහන් පරිදි වෙනස්කම් ඇති වන පරිසර දෙකක් දක්වන්න.

(ii) මෙහි සඳහන් යුගල පද දෙකක් උපුටා ලියන්න.

(iii) ඡේදයෙහි සඳහන් උපමා දෙකක් සඳහන් කරන්න.

(iv) ඡේදයෙහි ඇතුළත් උත්තම පුරුෂ බහුවචන නාමපදයක් සහ ක්‍රියා පදයක් ලියා දක්වන්න.

(v) පහත සඳහන් පද වල අරුත් පැහැදිලි කරන්න.

(අ) රක්ත වර්ණ

(ආ) හරිත පැහැය (ලකුණු 2 × 5 = 10)

(5) **පෙළ පොත ඇසුරින් අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) (අ) 'සිනා කුමාරි' පද්‍ය පන්තිය උපුටා ගත් කෘතිය කුමක් ද?

(ආ) එහි කතුවරයා නම් කරන්න.

(ඉ) එතුමා ලියූ ළමා ගීත නාටකයක් නම් කරන්න.

(ii) ''ඉදිරියේ දී පාටව කෙරෙමි''

(අ) මෙම උද්ධෘතය උපුටාගත් පාඩම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ඉ) 'පාටව කෙරෙමි' යි කීවේ කාට ද?

(iii) මා වැනි බිළින්දා

වර වර ළඟට කැන්දා

(අ) ඉහත පද්‍යයේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

(ආ) මෙම පද්‍යය කාගේ නිර්මාණයක් ද?

(iv) ''හොඳයි මම මීන් ගැලවෙන විදියක් කියන්නම්''

(අ) මෙහි 'මම' යනුවෙන් සඳහන් වන්නේ කවු ද?

(ආ) ඉහත ප්‍රකාශය අසා සිටියේ කවරෙක් ද?

(ඉ) 'ගැලවෙන විදියක්' යයි කීවේ කුමකින් ගැලවීමට ද?

(v) (අ) 'සඟ රජ වතගොත' නම් කෘතිය රචනා කළේ කවු ද?

(ආ) වැලිවිට සරණංකර සංඝරාජ හිමි වැඩ විසූ යුගය කුමක් ද?

(ඉ) උන් වහන්සේ ලියූ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් නම් කරන්න.

(ලකුණු 3 × 5 = 15 යි.)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - - 2019

## 7 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු පත්‍රය

---

### I කොටස

| | | | |
|---|---|---|---|
| 1. (2) | 6. (4) | 11. (3) | 16. (1) |
| 2. (3) | 7. (1) | 12. (3) | 17. (4) |
| 3. (2) | 8. (3) | 13. (1) | 18. (2) |
| 4. (4) | 9. (2) | 14. (2) | 19. (3) |
| 5. (3) | 10. (1) | 15. (1) | 20. (3) |

(2 × 20 = ලකුණු 40)

### II කොටස

01. (i) මාතෘකාව සඳහා - ලකුණු 01 යි
(ii) උපදෙස් දෙකක් සඳහා - ලකුණු 02 යි.
(iii) අත්දැකීම් දෙකක් ලිවීම සඳහා - ලකුණු 02 යි. මුළු ලකුණු 05යි.

02. මුළු ලකුණු 20යි.

03. ආකෘතිය සඳහා - ලකුණු 03 යි.
කරුණු සඳහා - ලකුණු 05 යි.
ශිල්පීය දක්ෂතා සඳහා - ලකුණු 02 යි.

04. (i) ගෙදර පරිසරය හා අවට පරිසරය
(ii) ගෙදර, දොර, ගහකොළ
(iii) රතු පලසක් එලූ කලක මෙන්, නව පණක් ලද්දාක් මෙන්
(iv) අපි දකින්නෙමු.
(v) (අ) රතු පාට
(ආ) කොළ පාට (ලකුණු 2 × 5 = 10යි)

05. (i) (අ) කෝමළ රේඛා
(ආ) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
(ඉ) සේපාලිකා
(ii) (අ) තිලමුට්ඨී ජාතකය
(ආ) දිසාපාමොක් ඇදුරු
(ඉ) බ්‍රහ්මදත්ත කුමරුට
(iii) (අ) දුක් සැප කුමන්දා
අසත නිරිඳෝ වෙන කොයින් දා
(ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
(iv) (අ) ගොවි බිරිය
(ආ) ගොවියා
(ඉ) ව්‍යාඝ්‍රයාගෙන්
(v) (අ) තිරාණගම රතනසාර හිමි
(ආ) සෙංකඩගල/ මහනුවර
(ඉ) මුනිගුණ අලංකාරය / සාරාර්ථ සංග්‍රහය / භේසජ්ජ මංජුසාව/භේසජ්ජ මංජුසා සන්නය / මහා බෝධි වංශ සන්නය / සතර බණවර සන්නය (ලකුණු 3 × 5 = 15යි)